මුදල් ප්‍රතිපත්ති විවරණය සැකෙවින්

2026 ජනවාරි

මහ බැංකුවේ අලුත් ම තීරණය කුමක් ද?

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය **නොවෙනස් ව** තැබීමට මහ බැංකුව තීරණය කළා.

7.75%

ආර්ථිකයේ වත්මන් තත්ත්වය?



- උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යමින් පවතිනවා.
- මෑත කාලීන ව සිදු වූ අයහපත් කාලගුණික බලපෑම් මධ්‍යයේ වුව ද, ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව අබණ්ඩ ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ වාහන ආයනයන ඉහළ යෑම හේතුවෙන් පෞද්ගලික අංශයේ ණය තවදුරටත් ප්‍රසාරණය වී ඇත.
- විශාල ණය සේවාකරණ ගෙවීම් සිදු කළ ද, 2025 වසර අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.8ක් ලෙස සටහන් වුණා.
- 2026 වසරේ මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල සමස්තයක් ලෙස ස්ථාවර මට්ටමක පවතිනවා.

අනාගතයේ දී ආර්ථිකයට කුමක් සිදු විය හැකි ද?



- උද්ධමනය ක්‍රමයෙන් ඉහළ ගොස් 2026 වසරේ දෙවන භාගය වන විට 5% ඉලක්කගත මට්ටමට ළඟා වනු ඇතැයි අපේක්ෂා කරනවා.
- ආර්ථිකයේ ඉල්ලුම ශක්තිමත් වීම සහ සුළි කුණාටුවේ බලපෑමෙන් පසු ව සිදු කෙරෙන නැවත ගොඩ නැඟීමේ කටයුතු ආර්ථික වර්ධනයට සහාය වනු ඇතැයි අපේක්ෂා කරනවා.

දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා සමීප ව නිරීක්ෂණය කරමින් සහ ආර්ථික වර්ධනයට සහාය වෙමින් උද්ධමනය 5%ක ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානමින් සිටිනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA